# ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# පුරප්පාඩු

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත අපේක්ෂිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරු :**

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II ශ්‍රේණිය, කථිකාචාර්ය (තහවුරු නොකළ), කථිකාචාර්ය (පරිවාස)**

**සුදුසුකම් :**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියෙන් වැඩිදුර තොරතුරු ලබා ගන්න.

## දේශීය වෛද්‍ය විද්‍යා පීඨය

| අධ්‍යයනාංශය | විශේෂීකරණය වූ ක්ෂේත්‍ර | වෙනත් කරුණු |
|---|---|---|
| රෝග විඥාණ අධ්‍යයනාංශය | රෝග විඥාණ, සෞඛ්‍ය හා වසංගතවේදය | ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ ) සාමාර්ථයක් සහිත ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධියක් සමග විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම තිබීම |
| දේශීය චිකිත්සා අධ්‍යයනාංශය | දේශීය චිකිත්සා | ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ ) සාමාර්ථයක් සහිත විශේෂ /ගෞරව උපාධියක් සමග /හෝ විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් තිබීම |

## දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

| අධ්‍යයනාංශය | විශේෂීකරණය වූ ක්ෂේත්‍ර | වෙනත් කරුණු |
|---|---|---|
| දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය | සෞඛ්‍ය සංචාරක, සත්කාරක කළමනාකරණය, සංචාරක කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ආර්ථික විද්‍යාව, යෝග, මනෝ චිකිත්සාව | අයදුම්කරුවන් හට ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත විශේෂ /ගෞරව උපාධියක් සමග/හෝ විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් තිබීම.<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයන්ගෙන් එක් ක්ෂේත්‍රයක් සඳහා ආචාර්ය උපාධියක් තිබෙන අයවළුන්ට ප්‍රමුඛතාවය හිමිවේ. |
| තාක්ෂණ අධ්‍යයනාංශය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ජෛව වෛද්‍ය ඉංජිනේරු/තාක්ෂණය, වෛද්‍ය තොරතුරු, ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික්ස්, දත්ත සන්නිවේදනය හා ජාල කළමනාකරණය, වෛද්‍ය උපකරණ, වෛද්‍ය රොබෝ විද්‍යාව, සෞඛ්‍ය තොරතුරු පද්ධති, මෘදුකාංග ඉංජිනේරු, Object Oriented Programing | අයදුම්කරුවන් හට ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත විශේෂ /ගෞරව උපාධියක් සමග/හෝ විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් තිබීම.<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයන්ගෙන් එක් ක්ෂේත්‍රයක් සඳහා ආචාර්ය උපාධියක් තිබෙන අයවළුන්ට ප්‍රමුඛතාවය හිමිවේ. |
| දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයනාංශය | ජෛව තාක්ෂණය, කෘෂිකර්මය, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, ජෛව රසායනය, අනුක ජීව විද්‍යාව ආහාර විද්‍යාව හා තාක්ෂණය | අයදුම්කරුවන් හට ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත විශේෂ /ගෞරව උපාධියක් සමග/හෝ විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් තිබීම.<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයන්ගෙන් එක් ක්ෂේත්‍රයක් සඳහා ආචාර්ය උපාධියක් තිබෙන හෝ ආචාර්ය උපාධියක් හදාරණ අයවළුන්ට ප්‍රමුඛතාවය හිමිවේ. |

## දේශීය සමාජීය විද්‍යා හා කළමනාකරණ අධ්‍යයන පීඨය

| අධ්‍යයනාංශය | විශේෂීකරණය වූ ක්ෂේත්‍ර | වෙනත් කරුණු |
|---|---|---|
| දේශීය සමාජීය විද්‍යා අධ්‍යයනාංශය | සමාජීය විද්‍යාව, භූගෝල විද්‍යාව, මානව විද්‍යාව, | අයදුම්කරුවන් හට ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත විශේෂ /ගෞරව උපාධියක් සමග/හෝ විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් තිබීම.<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයන්ගෙන් එක් ක්ෂේත්‍රයක් සඳහා ආචාර්ය උපාධියක් තිබෙන හෝ ආචාර්ය උපාධියක් හදාරණ අයවළුන්ට ප්‍රමුඛතාවය හිමිවේ. |
| කළමනාකරණ අධ්‍යයනාංශය | ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය, ගණකාධිකරණය, මෙහෙයුම් කළමනාකරණය | අයදුම්කරුවන් හට ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත විශේෂ /ගෞරව උපාධියක් සමග/හෝ විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් තිබීම.<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයන්ගෙන් එක් ක්ෂේත්‍රයක් සඳහා පශ්චාත් උපාධියක් (ආචාර්ය උපාධියක් /ව්‍යාපාර කළමනාකරණපති)තිබෙන අයවළුන්ට ප්‍රමුඛතාවය හිමිවේ. |

## ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ මධ්‍යස්ථානය

| තනතුර | විශේෂීකරණය වූ ක්ෂේත්‍ර | වෙනත් කරුණු |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II ශ්‍රේණිය, කථිකාචාර්ය (තහවුරු නොකළ), කථිකාචාර්ය (පරිවාස) | ඉංග්‍රීසි | අයදුම්කරු ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත ඉංග්‍රීසි විෂයෙන් විශේෂ/ගෞරව උපාධියක් සහිත සහ/හෝ දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම යන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සහිත විය යුතුය. |

## තොරතුරු තාක්ෂණය

| තනතුර | විශේෂීකරණය වූ ක්ෂේත්‍ර | වෙනත් කරුණු |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II ශ්‍රේණිය, කථිකාචාර්ය (තහවුරු නොකළ), කථිකාචාර්ය (පරිවාස) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, සයිබර් ආරක්ෂාව, ඊ-ඉගැනුම | අයදුම්කරුවන් හට ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත විශේෂ /ගෞරව උපාධියක් සමග/හෝ විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් තිබීම.<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයන්ගෙන් එක් ක්ෂේත්‍රයක් සඳහා ආචාර්ය උපාධියක් තිබෙන අයවළුන්ට ප්‍රමුඛතාවය හිමිවේ. |
| ක්‍රම ලේඛක සහ තොරතුරු පද්ධති විශ්ලේෂක | අපේක්ෂකයාට පහත ක්ෂේත්‍රයන්හි මනා දැනුමක් සහ වැඩ කිරීමේ පළපුරුද්දක් තිබිය යුතුය.<br>අධ්‍යාපන කළමනාකරණය හා තොරතුරු පද්ධති- සංවර්ධනය ක්‍රියාත්මක කිරීම උපදේශනය වින්ඩෝස් සහ ලිනක්ස් සේවාදයකයන් හා උපස්ථ සේවාදයකයන්- වින්‍යාස කිරීම ක්‍රියාත්මක කිරීම හා උපදේශන කිරීම දත්ත සමුදයන් සැලසුම් කිරීම හා කළමනාකරණය (MSSQL,MySQL,.NET,PHP, HTML, CSS හා Java Programming C#, Java Script හෝ වෙනත් ඒ හා සමාන භාෂා ජංගම යෙදුම් සංවර්ධනය | |
| උපදේශක (පරිගණක තාක්ෂණය) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඊ-ඉගැනුම | |

## වැටුප් පරිමාණය -

අ **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1** (U – AC 3 (I))
91,310 - 7X2,170 - 106,500 මාසික

ආ. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11** (U – AC 3 (II))
රු. 79,360 - 11 x 1,630 - 97,290 මාසික

ඇ. **කථිකාචාර්ය (තහවුරු නොකළ)** (U – AC 3 (III))
රු. 69,580 - 5 x 1,630 - 77,730 මාසික

ඈ. **කථිකාචාර්ය (පරිවාස)** (U – AC 3 (IV))
රු. 54,600 - 10 X1,335; - 67,590 මාසික

ඉ. **ක්‍රම ලේඛක සහ තොරතුරු පද්ධති විශ්ලේෂක** ( U-AS 2 (II))
රු. 50,625-3X1,335- රු..54,630 (EB) රු.. 55,965- 14X1,335- රු..74,655 මාසික

ඊ. **උපදේශක (**පරිගණක තාක්ෂණය)
රු.. 50,625-3X1,335- රු..54,630 (EB) රු.. 55,965- 14X1,335- රු..74,655 මාසික

(ඉහතින් දක්වා ඇති වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත වෙනත් දීමනාවන් ද ගෙවනු ලැබේ. තවද අධ්‍යයන දීමනාව, තනතුර අ හා ආ සඳහා වැටුපෙන් 151% ද තනතුර ඇ සඳහා වැටුපෙන් 131% ද තනතුර ඈ සඳහා වැටුපෙන් 115% ද පර්යේෂණ දීමනා වශයෙන් තනතුරු අ සිට ඈ දක්වා වැටුපෙන් 35% ගෙවනු ලැබේ.)

## වරප්‍රසාද

- තෝරාගත් අපේක්ෂකයින් ඔවුන්ගේ මාසික වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දයක වන අතර, විශ්වවිද්‍යාලය ඔවුන්ගේ වැටුපෙන් 15% ක දයකත්වයක් ලබා දෙන අතර එය 8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට සහ 7% විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කෙරේ. ඊට අමතරව, ඔවුන් සේවක භාර අරමුදලට දයකත්වය දක්වන අතර, ඊට වැටුපෙන් 3% ට සමාන මුදලක් විශ්වවිද්‍යාලය විසින් ලබා දෙනු ඇත.
- පාරිතෝෂික ගෙවීම 1983 අංක 12 හි පාරිතෝෂික ගෙවීමේ පනතේ විධිවිධානවලට අනුකූලව සිදු කෙරේ.
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11ශ්‍රේණිය හෝ ඉන් ඉහළ තනතුරු දරන්නන් සඳහා එක් අවුරුදු වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු හෝ අවුරුදු දෙක වැටුප් රහිත නිවාඩු සඳහා වසර 07 සේවා කාලය අවසානයේ සුදුසුකම් ලබනු ඇත. මෙම සප්ත වාර්ෂික නිවාඩුව එතෙර ගත කරන විට ඒ සඳහා ගුවන් යානා පත්‍ර ගාස්තු ලැබීමේ හිමිකම අයදුම්කරුට මෙන්ම කලත්‍රයාටද හිමිවේ.

## අයදුම් කරන්නේ කෙසේද -

නියමිත අයදුම්පත් සහ සුදුසුකම් ඇතුළුව වැඩිදුර තොරතුරු (කථිකාචාර්ය තනතුරු සඳහා 1997.11.21 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක.721 හා එහි සංශෝධනයන් සහ ක්‍රමවිශ්ලේෂක හා තොරතුරු පද්ධති සහ උපදේශක (පරිගණක තාක්ෂණ) යන තනතුරු සඳහා 1998.01.29 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක .725) ආයතන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිගෙන් (දු.ක. 033 221 5827 සහ shammika@gwu.ac.lk) කාර්යාල වේලාවන් තුළදී හෝ විශ්වවිද්‍යාල නිල වෙබ් අඩවිය වන http://gwu.ac.lk/ මගින් ලබා ගත හැක.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් (විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් ලබා ගත් අයදුම්පත්) ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල යන ලිපිනයට 2021.07.05 වන දිනට හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් අවශ්‍ය සියලුම සහතික පත්වල සහතික කරන ලද පිටපත් සමග උපාධියේ ශාස්ත්‍රීය පිටපත (transcript) සහිතව ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත්‍රය සමග එවා ඇති සහතික පත්‍ර පමණක් සම්මුඛ පරීක්ෂණයේදී සැලකිල්ලට ගැනේ.

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් **අදාළ සංවිධාන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.** ඔවුන්ට ප්‍රගමණ පිටපතක් සෘජුවම විශ්වවිද්‍යාලයට යැවිය හැකිය. නිසි ක්‍රමවේදය හරහා හෝ අවසන් දිනට පසුව හෝ ලැබෙන අයදුම්පත් **සලකා බලනු නොලැබේ.**

අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අපේක්ෂකයින් කෙටි ලැයිස්තු ගත කිරීමට සහ එවැනි අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට විශ්වවිද්‍යාලයට අයිතියක් ඇත. අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ හෝ අපැහැදිලි අයදුම්පත්, අදාළ ආකෘතියේ නොමැති අයදුම්පත් (විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත නොකළ) හෝ ප්‍රමාද වූ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී,**
**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය.**

**2021.06.21**